සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 09 - 2023

## සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

සැලකිය යුතුයි:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- කළු කර දක්වා ඇති කොටස්වල අදහස ඇති, හිස්තැනට වඩාත් ගැළපෙන සාම්ප්‍රදායික යෙදුම් තෝරා ඉරි අඳින්න.

01. **කරදර පිට කරදර පැමිණෙන්නේ** අහසින් හෙණ හඬ පාත්වෙන්නාක් මෙන්'යි අම්මා කීවිට .......................... ය'යි මල්ලී හඬනගා කීවේ ය.
    i. වැල්වටාරම් ii. බහින කලාව iii. සායම යනවා iv. කොරේ පිටට මරේ

02. ගුරුගෙදරට ගොස් ගුරුහරුකම් ලබා **ගුරුවරයාගේ ම දුර්ගුණ කියමින්** නිවසට යන සිරිදාස දුටු ගැමියෙකුගේ මුවින් පිටවූයේ .............................. යන්න ය.
    i. අඟුරු කිරෙන් සේදුවත් සුදු නොවේ ii. හැදෙන ගහ දෙපැත්තෙන් දැනේ
    iii. පිරුණු කළේ දිය නොසැලේ iv. අවි ගත්තෝ අවියෙන් ම නැසෙති

03. **බොහෝ කාලයකට පසු** මහ ගෙදරට පැමිණෙන ලොකු නැන්දාව දුරදීම දුටු තාත්තා "ඔය එන්නේ ............ යි මිමිනුවේ ය.
    i. කන කැස්බෑවා විය සිදුරෙන් අහස බලන්නා සේ
    ii. පය බරවායට පිටිකර බෙහෙත් බැන්දා සේ
    iii. ලෝකෙට පරකාසේ ගෙදරට මරගාතේ කීවා සේ
    iv. වඳින්න ගිය දේවාලේ ඉහේ කඩන් වැටුණා සේ

04. පහත දැක්වෙන අක්ෂර; උත්පත්ති ස්ථානය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

    **ච, ඡ, ජ, ඣ, ඤ**
    i. කණ්ඨජ ii. තාලුජ iii. දන්තජ iv. මූර්ධජ

05. ඕෂ්ඨජ අක්ෂරයක් යෙදී ඇති මල් වර්ගය දැක්වෙන පද වරහනෙන් තෝරා හිස්තැනෙහි යොදන්න.

    (අ) .............................................................................. (ආ) ..............................................................................

    (ඩේලියා / දෑසමන් / කිරිඉද්ද / ඕලු / පිච්ච / සූරියකාන්ත)

06. පහත දැක්වෙන වාක්‍යයේ අක්ෂර වින්‍යාසය වැරදියට දක්වා ඇති පද නිවැරදි කර නැවත ලියන්න.

    අධ්‍යාපන ක්ෂේත්‍රයේ ද නැතුව ම බැරි අංගයක් වන පරිගනකය, ඇතැම් පාසල් සිසුන් අවබාවිත කිරීම කනගාටුවට කරුණකි.

    (අ) .............................................................................. (ආ) ..............................................................................

07. අකාරාදී පිළිවෙළට යෙදී ඇති පද පේළිය තෝරන්න.
   i. අඬුව, උදැල්ල, මිටිය, කැත්ත
   ii. ගඩොල්, වැලි, යකඩ, සිමෙන්ති
   iii. පැන්සල, පෑන, පොත, මකනය
   iv. අත, ඇඟිලි, හිස, පය

08. පහත සඳහන් වාක්‍යයට යෝග්‍ය විරාම ලක්ෂණ යොදන්න.
ගත දැවටෙන මඳ පවන සුළඟ අහා කෙතරම් සුවදායක ද

09. වං හුං, ලවක් දෙවක්, අබල් බබල් යන යුගල පද සෑදෙන අයුරු දැක්වෙන ප්‍රකාශය කුමක් ද?
   i. විරුද්ධාර්ථ පද දෙකක් එක්වීමෙන් ය.
   ii. සමීප අර්ථ ඇති පද දෙකක් එක්වීමෙන් ය.
   iii. සමාන අර්ථ ඇති පද දෙකක් එක්වීමෙන් ය.
   iv. පද දෙකෙහි ම අර්ථය නැති පද දෙකක් එක්වීමෙන් ය.

10. වනාන්තරයෙන් නැඟුණු බියකරු හඬට සවන් යොමු කළ දරුවා බියෙන් අඬයි... මෙම වාක්‍යයේ යෙදී ඇති නාම හා ක්‍රියා විශේෂණ පද තෝරා ලියන්න.

(අ) ........................................................................ (ආ) ........................................................................

11. පහත දැක්වෙන වාක්‍යාංශවලට ගැළපෙන තනි පද ලියන්න.

(අ) කාලයට උචිත ..............................................................

(ආ) අනුන්ගෙන් පෝෂණය වන ..............................................................

12. පහත දැක්වෙන පද යොදාගෙන අර්ථවත් වාක්‍යයක් නිර්මාණය කරන්න.

ගීත / හඬපට / ළමා / ඇතුළත් / විඳින්න / අසා / රස

..........................................................................................................................................................

13. පහත දැක්වෙන කර්තෘ කාරක වාක්‍යය කර්ම කාරකයටත්, කර්ම කාරක වාක්‍යය කර්තෘ කාරකයටත් හරවා ලියන්න.

- ගුරුවරු දරුවන්ට නිරන්තරයෙන් අවවාද දෙති.

(අ) ..........................................................................................................................................................

- දිස්ත්‍රික් ලේකම්තුමා විසින් තම කාර්ය මණ්ඩලය දැනුවත් කරනු ලැබීය.

(ආ) ..........................................................................................................................................................

14. පහත දැක්වෙන අනුක්ත පදවලට උක්ත පද ලියන්න.

(අ) රිතීන් ........................................................ (ආ) අශ්වයෙකු .......................................................

15. පහත දැක්වෙන නාම පදවලට යෝග්‍ය උපසර්ග යොදා විරුද්ධාර්ථවත් පද ගොඩනගන්න.

(අ) .................................. සිරිත් (ආ) .................................. නම්බුව

16. වරහන තුළ දැක්වෙන පද අතුරෙන් මුලින් දැක්වෙන පදයට සමානාර්ථයක් නොදෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(අ) මුහුද - (රුවනාර, ජලනිධි, සින්ධු, උදක)

(ආ) සතුට - (ආනන්දය, මිණිමුතු, ප්‍රහර්ෂය, සතොස)

17. (අ), (ආ) යටතේ දක්වා ඇති වැරදි වාක්‍ය නිවැරදි කොට ලියන්න.

(අ) ගමේ ඇතැමෙකු නිවෙස්වලට වී කාලය ගත කරති.

.................................................................................................................................................

(ආ) මැණියෝ ස්වකීය දරුවෝ පෝෂණය කළහ.

.................................................................................................................................................

18. පහත දක්වා ඇති වචනවල අර්ථය ප්‍රකාශ වන පරිදි ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍යයක් ලියන්න.

(අ) ආශ්‍රිත .....................................................................................................................

(ආ) නිර්මාණශීලී .....................................................................................................................

19. නටයි, දරයි යන ක්‍රියා පදවල අතීත කාල උත්තම පුරුෂ, කර්තෘ කාරක, බහුවචන ක්‍රියා පද ලියන්න.

(අ) ........................................................................ (ආ) ........................................................................

20. පහත දැක්වෙන පද්‍යය සම්පූර්ණ කරන්න.

මල් පිපෙන පොකුණු ද

..............................................................

වතු පිටි මිණිමුතු ද

..............................................................

(ලකුණු 2 × 20 = 40යි)

## II කොටස

- ප්‍රශ්න අංක 01, 02, 03, 04 යන ප්‍රශ්නවලට හා 05, 06 යන ප්‍රශ්න දෙකෙන් (02න්) එකකට පමණක් පිළිතුරු සපයන්න.

**01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

i. දත් කැකුළු පාලා
සුරතල් සිනා සීලා
බොළඳ බස් දීලා
කෙළී සියොළඟ දූලි ගාලා

(අ) ඉහත පද්‍ය ඇතුළත් සාහිත්‍යය ග්‍රන්ථය කුමක් ද?
(ආ) එම ග්‍රන්ථයේ රචකයා නම් කරන්න.

ii. පහත සඳහන් ග්‍රන්ථ රචනා කළ කතුවරුන් නම් කරන්න.
(අ) සරු පොළවක් අපට ඇතේ - .........................................................
(ආ) සද්ධර්මරත්නාවලිය - .........................................................

iii. ධීවර භාෂාවේ යෙදෙන පහත පදවල පොදු වහර ලියන්න.
(අ) කෝඩය (ආ) හරාව

iv. නිවැරදි ශබ්ද උච්චාරණයට ශිෂ්‍යයා පුහුණු කිරීම සඳහා පැරණි අධ්‍යාපන ක්‍රමයේ දී භාවිත කළ කෘති දෙකක් ලියන්න.

v. (අ) හෙළ බසේ ස්වීයත්වය සුරැකීම උදෙසා මුනිදාස කුමාරතුංග මහතා විසින් ප්‍රකාශයට පත් කළ සඟරාව කුමක් ද?
(ආ) මෙම සඟරාව ප්‍රකාශයට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙස බිහි වූ සංවිධානය කුමක් ද?

(ලකුණු 2 × 5 = 10)

**02. පහත සඳහන් මඟ පෙන්වන ලද ඡේද අතුරින් එකක් තෝරා ගෙන වචන 200කට නො අඩු වන සේ රචනාවක් ලියන්න.**

i. පාසල් අධ්‍යාපනය තුළ කියවීම හා ලිවීම මූලික වෙයි. කියවීම ප්‍රගුණ කිරීමෙන් දැනුම වර්ධනය කර ගැනීමේ ඉඩකඩ විවර වෙයි. පොත පත පරිශීලනයෙන් ලබන අත්දැකීම් තම ජීවිතය ගොඩනගා ගැනීමට රුකුලක් වෙයි. මේ සියල්ල සලකා බලා **"කියවීම් මිනිසා සම්පූර්ණ කරයි"** යන මැයෙන් රචනාවක් ලියන්න.

ii. වර්තමානයේ ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය ඉතා ඉහළ මට්ටමක පවතියි. ඒ නිසාම නොදිරන කසළ වලින් පරිසරය අපවිත්‍ර ව ඇත. මෙම කසළ පිළිස්සීම මගින් වායු දූෂණය සිදු වේ. මෙවැනි තත්ත්වයන් මඟ හරවා ගැනීමට අප ද දායක විය යුතුය. මෙම කරුණු සැලකිල්ලට ගෙන **"ප්ලාස්ටික් හා පොලිතින් භාවිතය අවම කරමු"** යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.

iii. ජනකතාව, ජනකවිය අතීතයේ සිට ම ගැමි දිවි පෙවෙත රසවත් කළේ ය. වර්තමානයේ ද අපට ජන සාහිත්‍යයෙන් ලද හැකි ප්‍රයෝජන බොහෝ ය. මේවා අතීතයෙන් පාරම්පරිකව අප ලද සම්පත් ය. මෙම තොරතුරු පදනම් කර ගනිමින් **"අපේ ජන සාහිත්‍යය"** යන මැයෙන් රචනාවක් ලියන්න.

iv. නෙළුම් පිපුණු පොකුණු, ගලා හැලෙන දිය දහරා, මනාලියන් සේ දිස් වන මලින් පිරි තුරුලතා, සමනොළ, මිහින්තලා කඳු මුදුන්වල පූජනීයත්වයෙන් මගේ දේශය සුවඳවත් වෙද්දී විදේශයන්හි සැරිසරමින් ලෝකය සිසාරා ගිය ද මගේ රට තරම් උතුම් පින් බිමක් හමු නොවේ. මේ කරුණු ගැන සැලකිලිමත් වෙමින් **"මගේ රට මට අගෙයි"** යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ලකුණු 20යි)

**03. පෙළපොතේ ඇතුළත් පාඩම් ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

i. "බොහෝ කලක් ජීවත් වුව මැනව, අපි නුඹ වහන්සේට පිනට කන්ට, බොන්ට සමර්ථ වුම්හ"
(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් විසින් ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?

ii. "අද ම මගේ සහෝදරයන් දෙදෙනාට මා ලත් වස්තුව බෙදා දෙමි"
(අ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවුරුන් ද?
(ආ) මෙම වස්තුව ලැබීමට හේතු වූයේ කුමක් ද?

iii. "ජීවිතයේ අනපේක්ෂිත බිඳ වැටීම් සමූහයක් හමුවේ අකම්පිතව ඊට මුහුණ දී දස දිගෙහි ජය දද නැංවූ විද්වතෙකු ලෙස කීර්තියක් අත්කර ගැනීමට සමත් වූ මේ අසහාය මිනිසා සියලු දෙනාට ආදර්ශයකි."

(අ) ඉහත පාඨයෙහි අසහාය මිනිසා ලෙස හඳුන්වා ඇත්තේ කවුද?

(ආ) අකම්පිතව" යන්නෙහි අර්ථය ලියන්න.

iv. "නැවතත් එන බව නොකියා
හිරු අවරින් නැව් නැගී පසු
තනිව හඬන ලොවක් සමඟ
රැයට මුහුණ ලා ඉඳගෙන
ඔබ එනතුරු මඟ බලමින්
දිවි ගණනක් ගෙවනා විට
දෑසේ නිල් පැහැය සෙමෙන්
අඳුරට දිය විය නොදැනිම"

(අ) "හිරු අවරින් නැව් නැගී පසු" යන පද්‍ය පාඨයෙන් අදහස් වන්නේ කුමක් ද?

(ආ) දෑසේ නිල් පැහැය නැතිවීමට කවියා දක්වා ඇති හේතුව ලියන්න.

v. **පහත සඳහන් පද්‍යයේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.**
ගසක දොඩම් මදෙයි කියා කෑ දැ'යි අපෙ අම්මා
අහස තරුත් සඳෙයි සිතා පිළි'ලු දැයි අපෙ අම්මා
.......................................................................................
.......................................................................................

(ලකුණු 2 × 5 = 10යි)

04. ඔබ පාසලේ පරිසර නියමු කණ්ඩායම් රැස්වීමේ දී පාසල් භූමියේ පළතුරු වගාවක් ආරම්භ කිරීම සුදුසු බවට යෝජනා සම්මත කර තිබේ. ඒ සඳහා අවශ්‍ය පලතුරු පැළ ලබාදෙන ලෙස ඉල්ලමින් ඔබ ප්‍රදේශයේ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ කෘෂි පර්යේෂණ නිලධාරී වෙත යැවීමට ලිපියක් ලියන්න. පරිසර නියමු කණ්ඩායමේ ලේකම් ඔබ යැ'යි සිතන්න.

(ලකුණු 10 යි)

05. **පහත පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

විසල් මිහිලිය පවා මේ
වියළි කාලේ දුක් විඳි
හරිත පැහැ වූ
යළි වස්සානේ
හරිත පැහැ සළු හැඳ ගනී

වියළි කටු පඳුරේ පවා
මල් පිපේ එහි රොන් පිරේ
වැව පවා දිගු කලක් දුක් විඳි
නිල් සළුව අහිමි ව නිදී
එහෙත් ඈ වස්සානයේ
නිල් සළුව හැඩ කොට අඳී

දියණියේ නුඹ එකම ගවුමත්
විළි වැසෙන්නට ඇඳ ගනී
ඒ ගවුම ඇඳ වැවට බැස නා
එයම වේලෙනතුරු හිඳී
දිටිමි නුඹ පොඩි දියණියේ
මහ කනදරා වැව ඉමේ

කොහා මේ හඬ ගා ගයන්නේ
වසන්තේ ගීතම නොවේ
කුරුලු ඇහැ අසරණව තෙත් කළ
සෝ ගී ද නුඹ ගැන දුවේ

i. "හරිත පැහැ සළුව මැලවේ" යන්නෙන් කවියා අදහස් කරන්නේ කුමක් ද?
ii. නියං කාලයෙහි වැවෙහි ජලය සිඳී ගිය බව ප්‍රකාශ කරන පද පේළිය උපුටා දක්වන්න.
iii. "කොහා මේ හඬ ගා ගයන්නේ වසන්තේ ගීතය වේ" යන පද පේළියට අනුව කොහා ශෝක වන්නේ ඇයි? (ලකුණු 02)

iv. මෙම කවි පෙළ කියවීමේ දී ඔබේ සිතෙහි උපන් හැඟීම් 2ක් කෙටියෙන් දක්වන්න. (ලකුණු 04)

**06. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

නාට්‍ය රචකයා නාට්‍යයක් වේදිකාගත කිරීමේ නියැලෙන වුන් අතරින් එක් අයෙක් පමණි. බොහෝ විට නාට්‍යය නිෂ්පාදනය කරන්නේ රචකයා ම නොවේ. රචකයාගේ අදහස් වේදිකාව මත ගෙන හැර දක්වන්නේ නිෂ්පාදකයා ය. නාට්‍යයේ මුදුන් මුල රචකයා ය. කෙටි කතා, නව කතා, කවි කියවා රස විඳින අතර, ඒවා කාව්‍ය ගණයට අයත් නොවේ. නාට්‍ය, ටෙලි නාට්‍ය, චිත්‍රපට ආදිය නරඹා රස විඳිය යුතු ඒවා ය. ඒවා දෘශ්‍ය කාව්‍ය ගණයට අයත් වේ. නාට්‍යයක් නරඹන ප්‍රේක්ෂකයා නාට්‍යයේ සිදුවීම් මාලාව තමා ඉදිරියේ එවෙලේ ම සිදුවන්නක් ලෙස දකියි. කතාන්දරයක් කියවන පාඨකයා හෝ අසන ශ්‍රාවකයා හෝ එහි සිද්ධි හා අවස්ථා තම සිතෙහි චිත්ත රූප මවමින් පරිකල්පනය කරයි.

i. රචකයාගේ අදහස් වේදිකාව මත ගෙනහැර දැක්වීමට දායක වන්නේ කවුද?
ii. නාට්‍ය, චිත්‍රපට හා ටෙලි නාට්‍ය අයත් වන්නේ කුමන ගණයට ද?
iii. ප්‍රේක්ෂකයා යනුවෙන් හඳුන්වන්නේ කවුරුන් ද?
iv. තම සිතෙහි චිත්ත රූප මවමින් පරිකල්පනය ඇති කිරීමට හේතු වන්නේ මොනවාද?
පහත සඳහන් වචනවල අරුත් ලියන්න.
(අ) චිත්ත රූප (ආ) ගණය
(ලකුණු 10 යි)